මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/25/2024

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2024.12. 04

අයවැය චක්‍රලේඛ අංක: **03/2024 – (i)**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**අංක 2412/08 දරන 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව විෂයයන් බෙදා වෙන් කරන ලද නව අමාත්‍යාංශවල ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා 2023 අංක 34 දරන විසර්ජන පනත මගින් 2024 වර්ෂය සඳහා සම්මත වී ඇති ප්‍රතිපාදන යොදා ගන්නා ආකාරය**

අයවැය චක්‍රලේඛ 03/2024 හා බැඳේ.

02. 2024.11.25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් රජයේ විෂයයන් සහ කාර්යයන් නව අමාත්‍යාංශ 24 ක් යටතට වෙන් කර ඇත. ඊට සමගාමීව අයවැය චක්‍රලේඛ 03/2024 හි උපලේඛන 01 හා 02 සංශෝධනය විය යුතුවේ. ඒ අනුව 03/2024 චක්‍රලේඛයේ උපලේඛන 01 සහ 02 ඉවත් කර ඒ වෙනුවට මෙම චක්‍රලේඛයට අමුණා ඇති සංශෝධිත උපලේඛන 01 සහ 02 නිකුත් කර ඇත.

03. ඊට අමතරව, 2024 වසරේ ඉතිරි කාලය සඳහා අයවැය චක්‍රලේඛ 03/2024 හි 01.1 ඡේදය, 01.2 ඡේදය සහ 03.4 ඡේදය පහත පරිදි සංශෝධනය කර අදාල කරගත යුතුය.

***01.1 සැපයුම් හා සේවා වියදම්***

2024 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්කර ඇති 2023 අංක 34 දරන විසර්ජන පනතේ සීමාවන්ට යටත්ව, මෙම චක්‍රලේඛයට අමුණා ඇති සංශෝධිත උපලේඛන 01 හි දැක්වෙන වැය විෂය විස්තර යටතේ ඉතිරිව පවතින ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් නව අමාත්‍යාංශ විසින් 2024 වසරේ ඉතිරි කාලය තුල ස්වකීය අමාත්‍යාංශවල වියදම් කළමනාකරණය කර ගත යුතුය. මෙහිදී අයවැය චක්‍රලේඛ 03/2024 චක්‍රලේඛයේ 01 ඡේදයේ අනෙකුත් විධිවිධාන එපරිදිම අනුගමනය කළ යුතුය.

***01.2. අත්තිකාරම් ගිණුම් කටයුතු***

2023 අංක 34 දරන විසර්ජන පනත මගින් අනුමත කරන ලද අත්තිකාරම් ගිණුම් නව අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීමට අදාල තොරතුරු සහිත සංශෝධිත උපලේඛන 02 මේ සමඟ අමුණා ඇත. 2024 ඉදිරි කාලය තුල ණය ලබාදීමේදී අයවැය චක්‍රලේඛ 03/2024 හි 01.2 ඡේදයේ අනෙකුත් උපදෙස් තවදුරටත් නොවෙනස්ව පවතිනු ඇත.

*03.4. වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම*

*අමාත්‍යාංශ*

මහා භාණ්ඩාගාරය විසින් 2023 අංක 34 දරණ විසර්ජන පනතේ වැය විෂයයන් යටතේ ආවරණය වූ විෂයයන් හා කාර්යයන් අමාත්‍යාංශ වෙත බෙදී ගොස් ඇති ආකාරය අධ්‍යයනය කර 2024 වර්ෂය සඳහා වන වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම පැවරිය යුතු අමාත්‍යාංශය නිර්ණය කර අදාල තොරතුරු උපලේඛන 02 ට ඇතුලත් කර ඇත. ඒ අනුව 02 උපලේඛනයේ (1) වන තීරුව යටතේ දැක්වෙන නව අමාත්‍යාංශවල ලේකම්වරුන් වෙත එහි (2) තීරුවේ දැක්වෙන්නාවූ පෙර පැවති අමාත්‍යාංශවලට වෙන්කර තිබූ වැය ශීර්ෂවලට අදාලව 2024 වර්ෂය සඳහා වන වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ වගකීම පවරනු ලැබේ.

එසේ කිරීමට හැකිවන පරිදි රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී 2024 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන උපදෙස් අනුගමනය කරමින් ඒ ඒ වැය ශීර්ෂ සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම අදාල පෙර අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ/ප්‍රධාන ගණකාධිකාරිගේ මූලික වගකීමක් වේ.

*දෙපාර්තමේන්තු*

දෙපාර්තමේන්තුවක් අයත් වන අමාත්‍යාංශයේ යම් වෙනසක් ඇති වුවත් දෙපාර්තමේන්තුවල වැය ශීර්ෂ අංක හා විෂයයන් නොවෙනස් වන බැවින් දෙපාර්තමේන්තුවල ගිණුම් තැබීම පැරණි වැය ශීර්ෂ අංක අනුවම සිදු කළ යුතුය. එනමුත් අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වනුයේ එම දෙපාර්තමේන්තුව දැනට අනුයුක්ත වී ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

*අත්තිකාරම් ගිණුම් සඳහා වාර්ෂික සැසඳුම් ප්‍රකාශ*

නව අමාත්‍යාංශ අනුව 2023 අංක 34 දරන විසර්ජන පනතේ සඳහන් අත්තිකාරම් ගිණුම් අනුයුක්ත වන ආකාරය 02 උපලේඛනයෙහි (3) තීරුවෙන් දක්වා ඇත. ඒ අනුව අහෝසි වන අමාත්‍යාංශවලට අදාළ අත්තිකාරම් ගිණුම්වලට අදාළව 2024 වාර්ෂික සැසඳුම් ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ වගකීම ද නව අමාත්‍යාංශවල ලේකම්වරුන් හා ප්‍රධාන මූල්‍ය නිලධාරීන් වෙත පවරනු ලැබේ. 2024 වාර්ෂික සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ වගකීම පැරණි අමාත්‍යාංශවල ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරිවරුන් වෙත පැවරෙයි.

**04.** **මුදල් පොත් පියවීම හා අග්‍රිම ගිණුම් පියවීම**

2024 වර්ෂය සඳහා 2023 අංක 34 දරන විසර්ජන පනත ප්‍රකාරව ජාතික අයවැය චක්‍රලේඛ 03/2024 යටතේ අක් මුදල් නිදහස් කිරීම සිදුකරන බැවින් 2024.11.04 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 06/2020 ප්‍රකාරව 2024 මූල්‍ය වර්ෂය අවසානයේ මුදල් පොත් හා අග්‍රිම ගිණුම් පියවීමට කටයුතු කල යුතුය.

**05.**අයවැය චක්‍රලේඛ 03/2024 හි 02, 03.1, 03.2 03.3 හා 04 ඡේද තවදුරටත් ඒ ආකාරයෙන්ම අදාල කරගත යුතුය.

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම්.අනෝමා නන්දනී මහත්මිය (දු.අං.0112-484681) විමසා ලබා ගත හැකි ය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත් : (i). ජනාධිපති ලේකම්
(ii). අග්‍රාමාත්‍ය ලේකම්
(iii). අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(iv). විගණකාධිපති